# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2130/44 – 2019 ජූලි මස 04 වැනි බ්‍රහස්පතින්දා – 2019.07.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (1) වගන්තිය යටතේ, ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම සිදුකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම හා ලිපිනය* | *තනතුර* | *කාල සීමාව* |
|---|---|---|
| නීතිඥ ඩබ්. එම්. සෙනෙවිරත්න වීරසිංහ මහතා අංක 225, පන්සල පාර, නාවුල්ල, දෙමෝදර. | ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජික | 2019.04.01 දින සිට වසරක කාලයක් සඳහා |

ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2019 ජූලි මස 02 වැනි දින,
බදුල්ල, ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07 - 646/1


1A – PG 4585 – 32 (2019/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය : 01/10/03/04.

## ඌව පළාතේ පළාත් සභාව

### ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ඌව පළාත් ආණ්ඩුකාරවර ජනාධිපති නීතිඥ මාර්ෂල් පෙරේරා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ 154ඊ ව්‍යවස්ථාවේ (5) අනු ව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත සඳහන් පත්කිරීම කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඌව පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු හා සමාජ සුභසාධන කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය, අනුර විදනගමගේ මැතිතුමා.

ඌව පළාතේ මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, වතු යටිතල පහසුකම්, සමුපකාර කටයුතු සහ ද්‍රවිඩ අධ්‍යාපන (මුස්ලිම් පාසල් හැර) පිළිබඳ ගරු අමාත්‍ය අකලන් සෙන්දිල් තොන්ඩමාන් මුත්තුවිනායගම් මැතිතුමා 2019 ජූනි මස 28 වැනි දින සිට 2019 ජූලි මස 05 වැනි දින දක්වා විදේශගත වන හෙයින්, 2019 ජූනි මස 28 වැනි දින සිට එතුමා නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක්, එම විෂයභාර ගරු අමාත්‍යවරයා වශයෙන් වැඩ බැලීමට.

**මාර්ෂල් පෙරේරා,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2019 ජූලි මස 02 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07 - 646/2

---

මගේ අංකය : 01/10/03/04.

## ඌව පළාතේ පළාත් සභාව

### ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 33 (1) වගන්තිය යටතේ, ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර ආරිය බී රැකව මැතිතුමා විසින් පහත සඳහන් පත්කිරීම සිදුකර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *නම හා ලිපිනය* | *තනතුර* | *පත් කළ දිනය* |
|---|---|---|
| රාජරත්නම් ඥානසේකරන් මහතා<br>තැ. පෙ. 02, කොස්වත්ත වත්ත, හල්දුම්මුල්ල. | ඌව පළාත් සභා රාජ්‍ය සේවා<br>කොමිෂන් සභාවේ සාමාජික | 2018.10.12 වැනි දින සිට<br>වසරක කාලයක් සඳහා |

**ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය,**
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2019 ජූලි මස 02 වැනි දින,
බදුල්ල, ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

07 - 646/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.